කිසියම් කෙනෙකුට හෝ සුජූද් කරන මෙන් කිසිවකුට මම නියෝග කර ඇත්තේ නම්, බිරිය, තම සැමියාට සුජූද් කරන මෙන් මම නියෝග කර ඇත්තෙමි.

අබූ හුරෙය්රා -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. මෙය මර්ෆූඃ ගණයට අයත් හදීසයකි.“කිසියම් කෙනෙකුට සුජූද් කරන මෙන් කිසිවකුට මම නියෝග කර ඇත්තේ නම්,
බිරිය, තම සැමියාට සුජූද් කරන මෙන් මම නියෝග කර ඇත්තෙමි.“ [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් තිර්මිදි එය වාර්තා කර ඇත]

තමන් කිසිවකුට සුජූද් කරන මෙන් අණ කර ඇත්නම් බිරිය තම සැමියාට සුජූද් කරන මෙන් තමන් අණ කරනු ඇතැයි නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා දන්වා සිටියහ.එය, ඔහු විසින් ඇයට කළ යුතුකම්වලට ඇය කළ යුතු ගෞරවය කිරීමක් වශයෙනි. අල්ලාහ් හැර වෙනත් කිසිවකුට සුජූද් කිරීම තහනම්ය. එය පොදුවේ සුදුසු ක්රියාවක් නොවෙයි.

https://sunnah.global/hadeeth/si/show/5826